**මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.**

**(අ) 2009 සිට 2015 වර්ෂය දක්වා බාහිර ප්‍රතිපාදන අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 186 ක් සඳහා අදාළ ප්‍රතිපාදන රු.4,790,584 ක් 2016 දෙසැම්බර් 31 දින ලැබී තිබුණ ද, තවදුරටත් එම මුදල් කර්මාන්ත ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.**

**(ආ) 2014 වර්ෂයේ දී අවලංගු කර තිබූ කර්මාන්ත 37 ක ඇස්තමේන්තුගත වටිනාකම රු.9,747,000 ක් කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.**

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**

**මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 8 ක ශේෂ උපයෝගී ලේඛන සමග සැසඳීමේ දී රු.1,925,977 ක නොසැසඳීමක් අනාවරණය විය.**

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

**(අ) ලැබිය යුතු ගිණුම්.**

**සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ගිණුම් විෂයයන් 7 ක එකතු වටිනාකම රු.130,688,108 ක් වී තිබුණි. එයින් අවුරුදු 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් විෂයයන්වල එකතුව රු.45,434,270 ක් වූ අතර, අවුරුදු 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් විෂයයන්වල එකතුව රු.55,064,206 ක් වී තිබුණි.**

**(ආ) ගෙවිය යුතු ගිණුම්.**

**සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් විෂයයන් 2 ක එකතු වටිනාකම රු.34,679,806 ක් වී තිබුණි. එයින් අවුරුදු 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් විෂයයන්වල එකතුව රු.884,413 ක් වූ අතර, අවුරුදු 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් විෂයයන්වල එකතුව රු.19,298,351 ක් වී තිබුණි.**

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.**

**ගිණුම් විෂයයන් 3 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.12,522,809 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **2008 ජනවාරි 25 දිනැති අංක 1533/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය** | **සහා බල ප්‍රදේශයේ ඇඹරුම්හල්, බ්ලොක් ගල් කර්මාන්ත හා සංචාරක නිවාස යනාදී ස්ථාන 122 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි.** |
| (ආ) | **2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1980 අංක 47 දරන ජාතික** | **2016 වර්ෂයේ පරිසර බලපත්‍ර සම්බන්ධයෙන් සිදු කළ සමීක්ෂණය අනුව, සභාව විසින් පරිසර බලපත්‍ර ලබා ගත යුතු යැයි හඳුනා ගත් කර්මාන්ත** |

| | | | |
|---|---|---|---|
| | | පාරිසරික පනතේ 26 වගන්තිය සංශෝධිත පරිදි එහි 2 වන උපලේඛනයේ 3.3.1 වගන්තිය | 100 කින් රු.400,000 ක පරිසර බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| | i | මු.රෙ.104(3), 104(4) හා 105(4) | සභාව සතු බැකෝ ලෝඩරයක වම් පස වීදුරුව කැඩී යාමේ අනතුර සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණයන් සිදු කර, අලාභහානියට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | ii | මු.රෙ.371(2) | 2007 හා 2009 වර්ෂවල අවස්ථා 3 කදී ලබා දී තිබූ රු.10,693 ක් වූ අත්තිකාරම් මුදල් වසර 10 ක හා වසර 8 ක කාලයක් ගත වී ඇතත්, පියවීමට කටයුතු කර නොතිබුණි. |
| | iii | මු.රෙ. 571(3) | 2013 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 79 කට අදාළ රු.1,327,651 ක අත රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2.** මූල්‍ය සමාලෝචනය.

**2.1** මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.54,622,205 ක් වූ අතර, ඊට

අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.112,105,083 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.57,482,878 ක අඩුවීමක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය.**

----------------------

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය.**

--------------------------------------

වරිපනම්, බදු කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 96,754,946 ක ශේෂයක් හිඟ හිටව පැවතුණි.

**2.2.2 වරිපනම්.**

----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 ජනවාරි 01 දිනට හිඟ හිටි වරිපනම් ශේෂය රු.8,826,748 ක් වූ අතර, 2016 වර්ෂයේ බිල් කිරීම් රු.9,570,197 ක් විය. මින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අය කර තිබුණේ පිළිවෙළින් රු.3,598,383 ක් හා රු.7,190,217 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 41 ක් හා සියයට 75 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ ශේෂය රු.7,608,345 ක් විය.

(ආ) රාජ්‍ය ආයතන 3 ක වරිපනම් ඒකක 90 කින් වර්ෂ 1 ත් 11 ත් අතර කාලයක සිට හිඟව පැවති රු.261,564 ක වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වරිපනම් බදු අය වීම් ලේඛනයේ වරිපනම් හිමියාගේ නම නිශ්චිතව සඳහන් නොකර ගංගාරාම පන්සල, යනුවෙන් දක්වා තිබූ වරිපනම් ඒකක 37 කින් රු.60,113 ක වරිපනම් හා බෝවල කලාපයේ හා අම්පිටිය කලාපයේ හඳුනා ගත් නව වරිපනම් ඒකක 36 කින් රු.21,652 ක වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 5 කට වරක් නව තක්සේරුවක් කර බදු අය කළ යුතු වුවත්, සභාව විසින් 2006 වර්ෂයෙන් පසු නව තක්සේරුවක් සිදු නොකර පැරණි තක්සේරුව පදනම් කර ගනිමින් 2016 වර්ෂයට වරිපනම් බිල් කර තිබුණි.

**2.2.3 වෙනත් ආදායම්.**

**-------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) දැන්වීම් පුවරු ගාස්තු.**

**-------------------------**

**තැන්නේකුඹුර නගරය ආශ්‍රිතව පිහිටි වෙළඳ සැල් 5 ක වෙළඳ නාමයන් ප්‍රදර්ශනය කර තිබූ වර්ග අඩි 1266 ක ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු 5 කින් ලබා ගත හැකිව තිබූ රු.125,400 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අය කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ) කසළ බදු.**

**------------**

**කසළ බදු වෙනුවෙන් රු.1,500,000 ක ආදායමක් අය කර ගැනීමට අයවැය ඇස්තමේන්තු අනුමත කර ගෙන ඇතත්, 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.519,000 ක් පමණක් අය කර ගෙන තිබුණි.**

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**---------------------------**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.797,127 ක් හා මුද්දර ගාස්තු රු.83,466,955 ක් අය විය යුතුව තිබුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**---------------------------**

**3.1 කාර්යසාධනය.**

**-----------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ මංමාවත් හා පදික වේදිකා අලුත්වැඩියා කිරීම හා නඩත්තුව වෙනුවෙන් රු.100,000 ක ප්‍රතිපාදන සලසා ඇතත්, එම ප්‍රතිපාදන උපයෝජනය කර අදාළ සේවාවන් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ මහජන සෞඛ්‍ය වැඩසටහන් සඳහා සලසා ගෙන තිබූ රු.612,000 ක ප්‍රතිපාදනයෙන් රු.488,580 ක් උපයෝජනය කර නොතිබුණි.**

**(ඇ) පේරාදෙණිය නගරයේ පවත්වා ගෙන ගොස් තිබූ සති පොළ අත හැර දමා තිබූ අතර, වෙනත් ස්ථානයක සති පොළක් පවත්වා ගෙන යාමට ද කටයුතු කර නොතිබුණි.**

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**-----------------------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) කම්කරු සේවයේ තනතුරු හිමි සේවකයින් 11 දෙනෙකු කාර්යාලගත රාජකාරීවල හා රියැදුරු රාජකාරි සඳහා යොදවා තිබුණි.**

**(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 7 ඡේදයට අනුව එම චක්‍රලේඛ දිනෙන් පසු තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවකයින් බඳවා ගත හැක්කේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් පසුව බව දන්වා තිබිය දී, එවැනි අනුමැතියකින් තොරව ආදේශක පදනමින් සේවකයින් 6 දෙනෙකු බඳවා ගෙන 2016 ජනවාරි 8 සිට දෙසැම්බර් 31 දක්වා රු.936,930 ක වැටුප් ගෙවා තිබුණි.**

**(ඇ) සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය සේවකයින් 12 දෙනෙකුගෙන් වසර 17 කට වඩා වැඩි කාලයක සිට අය විය යුතු රු.520,757 ක ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ඈ) අනු බෙදුම් කළ ඉඩම්වලින් රු.15,927,736 ක් වටිනා ඉඩම් කට්ටි 13 ක් හා වටිනාකම ගණනය නොවූ ඉඩම් කට්ටි 7 ක් භෞතිකව හඳුනා ගෙන පොදු කටයුතු සඳහා යොදවා ගෙන නොතිබුණි.**

**(ඉ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව 2012 සිට 2015 දක්වා කාලය තුළ ගොඩනැගිලි සැලසුම් අයදුම් පත්‍ර 1027 ක් අනුමත කර ඇතත්, අනුකූලතා සහතික 115 ක් පමණක් නිකුත් කර තිබුණි.**

**3.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්.**

**-----------------------------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) ඊ - නැණ පියස මධ්‍යස්ථානය සඳහා 2015 ඔක්තෝබර් 19 දින රු.450,000 ක් වටිනා පරිගණක යන්ත්‍ර 6 ක් මිල දී ගෙන තිබුණු ද, ප්‍රමාණවත් ඉඩ කඩක් නොමැති බව දක්වා 2016 නොවැම්බර් 28 දින වන විටත් එය ආරම්භ කර නොතිබූ අතර, ඒ සඳහා මිල දී ගනු ලැබූ පරිගණක වසරකට වඩා වැඩි කාලයක සිට භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි.**

**(ආ) රු.340,156 ක් වටිනා තණ කොළ කපන යන්ත්‍රයක් සහ ට්‍රේලරයක් වසර 8 ත් 10 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.**

**3.4 හඳුනා ගත් අලාභ.**

**සභා කාර්යාල පරිශ්‍රයේ පිහිටි මහජන පුස්තකාලයේ රු.37,220 ක් වටිනා පුස්තකාල පොත් 219 ක් වර්ෂ 1 ත් 4 ත් අතර කාලයක සිට අස්ථානගත වී ඇතත්, ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.**

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය.**

**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ හා ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන මත කසළ වෙන් කිරීම සහිත ගොඩනැගිල්ල පිහිටි භූමියේ සමාලෝචිත වර්ෂයේ ආරක්ෂිත බැම්මක් ඉදි කිරීම සඳහා රු.1,782,990 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.**

**(අ) 2016 මාර්තු 10 දිනැති අංක 2/2016 දරන පළාත් පාලන චක්‍රලේඛය අනුව, පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහනේ අරමුණුවලට හා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 22 වගන්තිය ප්‍රකාරව අනු බෙදුම් කළ පිච්චමල්වත්ත ඉඩමේ පොදු කටයුතු සඳහා වෙන් කළ ඉඩම් කොටස එම අරමුණ සඳහා යොදා ගැනීමකින් තොරව කසළ කළමනාකරණය සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ලක ආරක්ෂාව සඳහා ආරක්ෂිත බැම්මක් ඉදිකර තිබූ අතර, ඉඩමේ හිමිකම් ඔප්පුව ද සභාව සතුව නොතිබුණි.**

**(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 178 වගන්තියේ (2), (2)(ඊ), (5) හා (7)(1) ඡේද හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2, 5.4.8(අ), 6.2.2 හා 6.3 වගන්තිවල සඳහන් විධිවිධානයන්ට අනුව, විධිමත් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට රු.4,266,610 ක මුදලකට ඉදිකිරීම් පවරා තිබුණි.**

**(ඇ) 2016 දෙසැම්බර් 28 දින පරීක්ෂණ අවස්ථාව වන විටත් ඉදි කරමින් තිබූ ආරක්ෂිත බැම්මේ කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියට නොතිබූ අතර, කොන්ක්‍රීට් මිශ්‍රණය සඳහා ප්‍රමිතියට අනුකූල නොවූ ගල් යොදා ගෙන තිබුණි.**

**3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

**අම්පිටිය, තැන්නේකුඹුර, පේරාදෙණිය, හන්තාන හා මහකන්ද යන කලාපවලින් දෛනිකව එකතු කරන කසළ ටොන් 5 කින් දිරන කසළ ටොන් 2 ක් පමණ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් නිෂ්පාදන අංගනය වෙත ගාස්තු සහිතව භාර දෙන අතර, ඉතිරි කසළ ටොන් 3 ක් පමණ අවිධිමත්ව බැහැර කර තිබුණි.**

**3.7 අවිධිමත් කටයුතු.**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119 වෙළුම ix දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙහි 1 ඡේදයේ නියමයන්ට පරිබාහිරව සභාව විසින් කමිටු රැස්වීම් රාජකාරී වේලාව තුළ දී පවත්වා සමාලෝචිත වර්ෂය තුළ රු.279,000 ක කමිටු දීමනා ගෙවා තිබුණි.**

**(ආ) ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටු සඳහා අදාළ දිනයන්වල සහභාගී නොවූ නිලධාරීන් 4 දෙනෙකුට රු.15,000 ක කමිටු දීමනා ගෙවා තිබුණි.**

**(ඇ) කොටස් කර විකුණන ලද ඉඩම්වල ප්‍රජා විනෝද කටයුතු වෙනුවෙන් සභාවට වෙන් කරන ලද ඉඩම් කොටස් අවිධිමත්ව බාහිර පාර්ශවයන්ට බදු දීම සම්බන්ධව විගණන විමසුම් මඟින් පෙන්වා දී තිබුණ ද, මෙම ඉඩම් සම්බන්ධව නැවත 2016 නොවැම්බර් 23 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී හන්තාන බටහිර කොටසේ ප්‍රයිම් ලැන්ඩ් ඉඩමේ සභාවට ලැබී තිබුණු ලොට් අංක 11 හා 12 ඉඩම් කොටස්වල අනවසර ඉදි කිරීම් තවදුරටත් සිදු කරමින් තිබුණි.**

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 අයවැය පාලනය.**

**සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් වියදම්, තථ්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේ දි ආදායම් විෂයයන් 2 ක සියයට 32 සිට සියයට 47 දක්වා ද, වියදම් විෂයයන් 5 ක සියයට 20 සිට සියයට 57 දක්වා විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.**

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

**සමාලෝචිත වර්ෂයේ රු.33,754,661 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 සංයුක්ත සැළැස්ම.**

**සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.4 ක්‍රියාකාරී සැළැස්ම.**

**----------------------**

**සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.5 අභ්‍යන්තර විගණනය.**

**-----------------------**

**විගණන විමසුම් සඳහා පිලිතුරු සකස් කිරීම හා වෙනත් රාජකාරි අභ්‍යන්තර විගණනයට පැවරීම හේතුවෙන් ප්‍රමාණවත් හා ස්වාධීන අභ්‍යන්තර විගණනයක් සිදු  කිරීමට නොහැකි වී තිබුණි.**

**5. පද්ධති හා පාලනය.**

**-----------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.**

**(අ) කොන්ත්‍රාත් පරිපාලනය**

**(ආ) ආදායම් පරිපාලනය**

**(ඇ) වත්කම් කළමනාකරණය**

**(ඈ) ණයගැතියන් හා ණයහිමියෝ**